**මාතලේ මහා නගර සභාව**

**මාතලේ දිස්ත්‍රික්කය**

---------------------

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 28 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 06 දින මහානගර සභාවේ නගරාධිපතිවරයාට යවා ඇත.

1.2 මතය

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට මාතලේ මහානගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.2,825,440ක් සහ වෙනත් ආදායම් රු.15,888,399ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ආ). වෙළඳ සංකීර්ණයේ එකවර ගෙවීමේ ගාස්තු ආදායම රු.14,094,990ක්ද, කර්මාන්ත ආධාර වටිනාකම රු.5,087,601ක්ද, කර්මාන්ත ණයගැති ශේෂය රු.980,000ක්ද වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඇ). අනවසර ඉදිකිරීම් වෙනුවෙන් අයකර ගෙන තිබුණු රු.117,822ක් සහ රු.169,457ක් වූ ආයුර්වේද ඖෂධ තොගයේ අගය ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ). දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කල යුතුව තිබුණු එකතු කල අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු වටිනාකම රු.968,787ක් වැඩියෙන් ගිණුම්වල දැක්වුණි.

(ඉ). සුනාමි ව්‍යාපෘතියට ලැබී තිබුණු රු.2,918,284ක මුදල එම ගිණුමට ගිණුම්ගත නොකර සංවර්ධන ගිණුමට ගිණුම්ගත කර තිබුණි.

(ඊ). නිලධාරීන් 42 දෙනෙකුගෙන් ලබාගෙන තිබුණු රු.139,000ක සේවක ඇප තැන්පත් ගිණුම්ගත කර නොතිබුණි.

(උ). පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු ටිපර් රථය, කෲ කැබ් රථය හා ට්‍රැක්ටරයේ වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ). සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂ 03කට අදාලව අවස්ථා 11කදී වෙළඳ බලපත්‍ර, ව්‍යාපාර බදු හා විනෝද බදු ලෙස ලැබී තිබුණු රු.132,500ක ආදායම් ගැලපීම් නොකර තැන්පත් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(එ). 2010 වර්ෂයේ හොකී ක්‍රීඩාපිටියේ ආරක්ෂක දැල් සවි කිරීම වෙනුවෙන් වැය කර තිබුණු රු.350,000ක මුදල එම වර්ෂයේදීම ප්‍රතිපූරණය වී තිබුණු නමුත්, තව දුරටත් තැන්පත් යටතේ ගිණුම්ගත කර තිබුණි.

### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.68,643,485ක් වූ ගිණුම් විෂයයන් 07කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.15,421,201ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

### 1.3.3 ලැබිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 05ක එකතුව රු.63,232,413ක් වූ අතර, වර්ෂ 05කට වැඩි කාලයක් ඉක්මවූ එකතුව රු.5,514,124ක ශේෂ 02ක් ඊට ඇතුළත් වී තිබුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ණයහිමි ගිණුම් ශේෂ 05ක එකතුව රු.123,077,753ක් වූ අතර, වර්ෂ 03කට වැඩි කාලයක් ඉක්ම වූ රු.61,748,803ක ශේෂ 04ක් ඊට ඇතුළත් වී තිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.16,903,615ක් වූ ගිණුම් විෂයයන් 09කට අදාළ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

1.3.6 නීති,රීති, රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති,රීති, රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති, රීති, රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 371(2) (ඇ) | 1997 සිට 2013 වර්ෂය දක්වා අවස්ථා 17කදී සභාවේ නිලධාරීන්ට දෙන ලද රු.335,623ක අත්තිකාරම් නිරවුල් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571(2) | එකතුව රු.2,579,741ක් වූ තැන්පතු ශේෂ 69ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ආ). 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත නොවූ තනතුරු 23ක් සඳහා බඳවා ගැනීම් සිදුකර තිබුණු අතර,දීමනා ලබමින් සිටි වාහන පාලකවරුන් 5 දෙනෙකුට හා පෙර පාසැල් පාලිකාවන් 11 දෙනෙකුට ස්ථිර තනතුරු ප්‍රදානය කර තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
-------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,503,620ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.31,773,038ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.16,269,418ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
-------------------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 02ක කාලපරිච්ඡේදය තුළ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ වැදගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

(අ). මුළු වියදම මුළු ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස ගත් විට මෙම ප්‍රතිශතයේ ඉහළ යාමක් පෙන්නුම් කෙරෙන අතර, මූල්‍ය පාලනය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් එමඟින් පෙන්නුම් නොකෙරුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු.33,561,458ක ඌන කාරක ප්‍රාග්ධන තත්ත්වයක පැවති අතර, එය ඉකුත් වර්ෂයට වඩා රු.8,728,295කින් වර්ධනය වීමක් විය.

(ඇ). ජංගම වත්කම් අනුපාතය සැලකූ විට ජංගම වගකීම් ආවරණය කර ගැනීමට ප්‍රමාණවත් මට්ටමක ජංගම වත්කම් නොපැවති බව නිරීක්ෂණය විය.

(ඈ). සමුච්චිත අරමුදලේ ශේෂය තවදුරටත් සෘණ අගයක් ගෙන තිබුණු අතර, එය අඛණ්ඩව වැඩිවන අගයකින් වර්ධනය වෙමින් පැවතුණි.

2.3 ආදායම් පරිපාලනය
------------------------

2.3.1 වරිපනම් බදු
---------------

හිඟ හිටි වරිපනම් බදු ශේෂය රු.23,966,803ක් වූ අතර, හිඟ ආදායම් රැස් කිරීම සඳහා ප්‍රමාණවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොකිරීම නිසා වර්ෂයකට වඩා පෙර සිට පැවත එන රු.10,568,111ක ශේෂ ඊට ඇතුළත්වී ඇති බව දක්නට ලැබුණි.

2.3.2 ජල ගාස්තු

-------------

2001 වර්ෂයේ සිට නොවෙනස් ඉදිරියට ගෙනෙමින් පවතින ජාතික ජල සම්පත් මණ්ඩලයෙන් අයවිය යුතු හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.4,802,812ක් විය.

2.3.3 බදු කුලී

-----------

හිඟ හිටි බදු කුලී ශේෂය රු.3,679,075ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂ 05කට වැඩි කාලයක් ඉක්මවූ රු.711,312ක ශේෂ ඇතුළත්වී තිබුණි.

2.3.4 එකවර ගෙවීමේ ගාස්තු (Key-money)

------------------------------------------

සාප්පු සංකීර්ණයේ එකවර ගෙවීමේ ගාස්තු හිඟ ශේෂය රු.15,318,499ක් වූ අතර, එම ශේෂය තුල වර්ෂයකට වඩා පෙර සිට පැවත එන රු.9,870,827ක හිඟ හිටි ශේෂ ඇතුළත්වී තිබුණි.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,604,950ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.13,732,530ක මුදලක් අයවිය යුතුව තිබුණි.

2.4 අධිභාර

---------

මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 226(1) වගන්තියේ විධිවිධාන යටතේ ඉකුත් වර්ෂයකදී පනවන ලද අධිභාරයකට අදාලව රු.41,859ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 කාර්ය සාධන ඇගයීම

-------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). මහානගර සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී කසළ වෙන් කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම, ගෝසාතකාගාරයක් ඉදි කිරීම, ඉඩම් වැඩිදියුණු කිරීම හා නිර්මාණය සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණද,එකී කාර්යයන් ඉටුකර නොතිබුණි.

(ආ). වැටුප් හා වේතන වියදම රු.144,643,766ක් වූ නමුත්, පළාත් සභාවෙන් ප්‍රතිපූරණය වී තිබුණේ ඉන් රු.109,517,612ක් පමණක් නිසා රු.35,126,154ක් වැටුප් හා දීමනා සඳහා සභා අරමුදලින් දැරීමට සිදුවී තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
--------------------------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා මහානගර සභාව වෙත ලැබී තිබුණු වටිනාකම රු.138,538ක් වූ අගරු චෙක්පත් 06ක් නිවැරදිව හඳුනාගෙන ගිණුම්වලට අදාල ගැලපීම් කර නොතිබුණි.

(ආ). පුස්තකාල කාර්යසාධන තරඟයේ ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා පළාත් පාලන කොමසාරිස් විසින් ලබා දී තිබුණු රු.190,000ක ප්‍රදානය තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ). නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ඖෂධ සංයෝජක තනතුර සඳහා කාර්යාල කාර්ය සහායකයෙකු අනුයුක්ත කර තිබුණු අතර, 2010 වර්ෂයේ පත් කර තිබූ ආයුර්වේද ඩිස්පැන්සරි සේවිකාවද මහානගර සභාවේ වෙනත් අංශයක සේවය සඳහා අනුයුක්ත කර තිබුණි.

(ඈ). මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමකින් තොරව කායවර්ධන උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් රු.992,700ක් වැයකර තිබුණු අතර, එම උපකරණ කිසිදු ප්‍රයෝජනයකට නොගෙන පෙරපාසැල් ගොඩනැගිල්ලක් තුළ රඳවා තිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
--------------------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 1994 සිට 2007 දක්වා කාලපරිච්ඡේදයට අදාලව අවස්ථා 17කදී බාහිර පාර්ශවයන්ට දෙන ලද රු.345,670ක අත්තිකාරම් පියවා ගෙන නොතිබුණි.

(ආ). විශ්‍රාම ගොස් විදේශගත වූ සේවකයෙකු වෙනුවෙන් මාස 17ක් සඳහා ගෙවිය යුතු එකතුව රු.87,119ක විදේශ විශ්‍රාම වැටුප් මුදල නිරවුල් නොකර, තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ). අනියම් කම්කරුවන් ලෙස සේවය කර ස්ථිර පත්වීම් ලැබූ සේවකයින් වෙනුවෙන් 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදලට යැවිය යුතු රු.985,539ක්වූ දායක මුදල් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඈ). 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 21 වගන්තිය අනුව ගොඩනැගිලි සැලසුම් අනුමත කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ

දෙක තුළ ලැබී තිබුණු අයදුම්පත් 749කින් 502ක් සඳහා අනුමැතිය ලබා දී තිබුණ ද අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ ඉන් අයදුම්පත් 49ක් සඳහා පමණි.

(ඉ). 1999 සිට 2003 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේදී ස්ථාන මාරු වී ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 132 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,072,483ක ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

(ඊ). තමගාවා නිවාඩු නිකේතනයේ හා අඹගහමුල වෙළඳ සංකීර්ණය පිහිටි ඉඩමේ අයිතිය හිමිකම් ඔප්පුවක් මඟින් හෝ පැවරුම් නියෝගයක් මඟින් තහවුරු කරගෙන නොතිබුණි.

(උ). ඉඩම් ඔප්පු, පැවරුම් නියෝග අනුව මහා නගර සභාව සතු ඉඩම් 13ක් භෞතිකව හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ). 2002 වර්ෂයේ සිට හෝටල් පාසැලක් ඉදිකිරීම සඳහා වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව වෙත ඉඩම් කොටසක් ලබා දී තිබුණද, එමඟින් ආදායමක් උපයාගැනීමට කටයුතු කර නොතිබුණු අතර, සමස්ථ ලංකා බෞද්ධ කාන්තා සම්මේලනයට බදු දී තිබුණු ඉඩම් කොටසෙන් අයවිය යුතු රු.20,000ක මුදලක් අයකරගෙන නොතිබුණි.

3.4 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

පිරිවැය රු.7,755,414ක් වූ වාහන 10ක් නිශ්ක්‍රීයව පැවති අතර, අක්‍රීය වූ බ්ලොක්ගල් ව්‍යාපෘතියේ රු.179,580ක් වටිනා කුට්ටිගල් 5986ක්ද, රු.787,056ක් වටිනා බ්ලොක්ගල් 16,397ක් හා රු.168,789ක් වටිනා බ්ලොක්ගල් නිෂ්පාදන යන්ත්‍රයක් අභාවිතව පැවතුණි.

3.5 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

2012 වර්ෂයේදී සේවකයින්ගේ නිල ඇඳුම් සඳහා මිලදීගෙන තිබුණු වටිනාකම රු.157,500ක අඟල් 60 පළල තැඹිලි පාට රෙදි මීටර් 375ක්, නිකුත් කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගබඩාවේ ඉතිරි වී තිබුණි.

3.6 අවිධිමත් ගනුදෙනු

----------------------

මුදල් රෙගුලාසි 610 ප්‍රකාරව භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් විමසීමකින් තොරව මාතලේ මහානගර සභාව විසින් රාජ්‍ය නොවන සංවිධානයක් සමඟ සෘජුවම ගිවිසුම්වලට එළඹී යුරෝපීය සංගමයේ රු.10,204,165ක විදේශාධාර ලබාගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලපරිච්ජේදයෙන් අවසන් වන විට, අදාල කාර්යයන් සඳහා වියදම් දැරීමට අනුමැතීන් ලබා ගැනීමට නොහැකි වීම මත, සුනාා ව්‍යාපෘතියට අදාල බැංකු ජංගම ගිණුමේ රු.5,132,798ක ශේෂයක් නිශ්කාර්යව පැවතුණි.

3.7 හඳුනාගත් අලාභ

--------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 1991 සිට 2013 දක්වා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල් ප්‍රමාද වී යැවීම නිසා රු.111,078ක අධිභාර මුදලක් සභා අරමුදලින් ගෙවීමට සිදු වී තිබුණි.

(ආ). අවම මිල ගණන් මත පාසැල් පොත් මිලදී නොගැනීම නිසා සභාවට රු.57,480ක පාඩුවක් සිදු වී තිබුණි. මිලදීගෙන තිබුණු පොත්වලින් 20,329ක් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකර, නිකුත් කර තිබුණු අතර, රු.80,175ක් වටිනා පොත් තොගයක් බෙදා නොහැර ගබඩාවේ තිබුණි.

(ඇ). වාරියපොළවත්ත නැමති පෞද්ගලික ඉඩමට කසළ බැහැර කිරීම නිසා එමඟින් පරිසරයට සිදුවන හානිය සම්බන්ධයෙන් සභාවට එරෙහිව අංක එස්.සී.එෆ්.ආර්.290/2008 දරන නඩුව පවරා තිබුණි. 2008 සිට 2014 වර්ෂය දක්වා නීතිඥ ගාස්තු වෙනුවෙන් රු.1,855,818ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණු නමුත්, නඩුව අවසන් වී නොතිබුණි.

3.8 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| ප්‍රතිපාදන | කර්මාන්තයේ නම | වැයකර තිබුණු මුදල | භෞතිකව පරීක්ෂා කළ දිනය | | අඩුපාඩුව |
|---|---|---|---|---|---|
| ---------------- | -------- | ------------- රු. | --------- | | ---------------- |
| (අ). ග්‍රාමීය පාලම් හා ප්‍රවේශ මාර්ග සංවර්ධන ප්‍රදාන | එම්.සී.පාර බොරළු ක්‍රීඩාංගනය ඉදිරිපස ප්‍රවේශ මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම | 394,000 | 2015.01.13 | (i) | 1:2:4 (3/4) මිශ්‍රණයෙන් මි.මී.0.125 ඝණකමට කොන්ක්‍රීට් යෙදිය යුතු වුවත්, කොන්ක්‍රීට් ඝණකම මි.මී.0.0889ක්ව පැවතුණි. |
| | | | | (ii) | කොන්ක්‍රීට් ඝණ මීටර් 27.5ක් සඳහා රු.352,000ක් ගෙවීම් කර තිබුණද,කොන්ක්‍රීට් ඝණ මීටර් 18.9ක් පමණක් යොදා තිබීමෙන්, ඝණ මීටර් 8.6ක් සඳහා වැඩිපුර රු.110,080ක් ගෙවා තිබුණි. |
| (ආ). ගමනැඟුම සංවර්ධන ප්‍රදාන | පුල්ලෙයාර් කෝවිල් පාරේ ඩයනා කර්මාන්ත ශාලාව අසළ සිට ප්‍රධාන මාර්ගය දක්වා දෙපස කාණු පද්ධතිය ඉදි කිරීම | 980,000 | 2015.01.13 | (i) | වැඩ විෂයය අංක 03 යටතේ කාණු පද්ධතිය ඉදි කිරීමේදී අඟල් 9න් 9ට මි.මී.10 කම්බි යොදා වැර ගැන්විය යුතු වුවත්, අඟල් 8,10,11 හා 12 වශයෙන් පරතරය ඇතිව වැර ගැන්වීම් යොදා තිබුණි. |

(ii) වැඩ විෂයය අංක 02 යටතේ කාණු පද්ධතිය ඉදි කිරීම සඳහා 1:2:4 මිශ්‍රණය යෙදිය යුතු වුවත්, 1:12:15 මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් යොදා තිබුණි.

3.9 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

මහානගර සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු කරනු ලබන ටොන් 28ක පමණ කසළ ප්‍රමාණයෙන් ටොන් 5-6 අතර, ප්‍රමාණයක් සෙවනත නැමති පුද්ගලික ආයතනයක් කොම්පෝස්ට් නිෂ්පාදනයට යොදාගනු ලබන අතර, ඉතිරි ප්‍රමාණය වාරියපොළවත්ත නැමති ඉඩමට බැහැර කර තුනී කරනු ලබයි. සමාලෝචිත වර්ෂයේදී කසළ තුනී කිරීම සඳහා යොදවාගත් එක්ස්කැවේටර් යන්ත්‍ර සඳහා රු.3,616,166ක මුදලක් කුලී ගාස්තු වශයෙන් සභා අරමුදලින් වැයකර තිබුණු අතර, නිෂ්පාදනය කරන ලද කොම්පෝස්ට් අලෙවිය මඟින් පෞද්ගලික ආයතනයක් ආදායම් උපයාගෙන තිබුණද, මහානගර සභාවට කිසිදු ආදායමක් ලබාගෙන නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

-------------------------

1989 ජනවාරි 20 දිනැති අංක 541/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ III වැනි කොටසේ 13 වන වගන්තිය ප්‍රකාරව මහානගර සභාවේ ස්වාධීන අඛණ්ඩ අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වා නොතිබුණු අතර ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 134 (2) අනුව අභ්‍යන්තර විගණන වැඩසටහන්ද පිළියෙල කර නොතිබුණි.

4.2 විගණන හා කළමණාකරණ කමිටු

--------------------------------------

2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක සීපීසී/සීඑල්ජී/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, විගණන හා කළමණාකරණ කමිටු පිහිටුවීමට පියවරගෙන නොතිබුණි.

4.3 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂය තුලදී අයවැය ලේඛනය සංශෝධනයට භාජනය කිරීමෙන් අනතුරුවද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(අ). ආදායම් විෂයයන් 18ක ඇස්තමේන්තුගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර සියයට 2 සිට සියයට 68 අතර පරාසයක විචලනයන් පැවතුණි.

(ආ). වැය විෂයයන් 27ක් සඳහා සලසා තිබුණු රු.30,523,700ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණු අතර, තවත් වැය විෂයයන් 71ක ශුද්ධ ප්‍රතිපාදනය සහ තථ්‍ය වියදම් අතර සියයට 1 සිට සියයට 69 දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

4.4 නොවිසඳී ඇති හා පිළිතුරු නොලත් විගණන විමසුම්

--------------------------------------------------------------------------------------

2014 දෙසැම්බර් 31 දින වන විට සභාව වෙත ඉදිරිපත් කර තිබුණු විගණන විමසුම්වලින් විමසුම් 10කට පිළිතුරු සපයා නොතිබුණු අතර, එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනුවල ගණනය කළ හැකි වටිනාකම රු.17,404,219ක් විය.

5. පද්ධති හා පාලන

-----------------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය
(ආ). ආදායම් පරිපාලනය
(ඇ). වත්කම් කළමනාකරණය
(ඈ). ණයගැති සහ ණයහිමි පාලනය
(ඉ). ගබඩා පාලනය
(ඊ). කොන්ත්‍රාත් පරිපාලනය
(උ) මානව සම්පත් කළමනාකරණය